**වර්තමාන තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය - 2018**

-----------------------------------------------------------------------------------------------

## 1.1 අභිතකර මතය.

වර්තමාන තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ (ඉදිරියේ දී හානි පූර්ණය කාර්යාලය සඳහා වන අනුප්‍රාප්තික) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 අභිතකර මතය සඳහා පදනම.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන.

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු.

| විගණන නිරීක්ෂණය. | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය. |
|---|---|---|---|
| (i). | 2018 දෙසැම්බර් 31 දිනට වාහන 03 ක ක්ෂය කළයුතු අගය රු.420,703 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1 - 12 මගින් ඉදිරිපත් කර තිබූ ජංගම නොවන වත්කම් පිළිබඳව වූ සටහනේ එම අගය රු.239,059 ක් ලෙස සටහන්ව තිබුණු අතර එකී වෙනසට හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි. | පසුගිය වර්ෂ වලින් ඉදිරියට ගෙනා වත්කම් ශේෂයන් මත අදාල ක්ෂය වීම් ගණනය කර ඇති බව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුවේ. |
| (ii). | විධිමත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීමකින් තොරව 2015 වර්ෂයේ සිට අයකර ගතයුතු රු.4,375,312 ක ණය ශේෂයක් සඳහා සියයට සියයක අඩමාන ණය ප්‍රතිපාදනයක් සමාලෝචිත වර්ෂයේ අවසානයට සිදු කර තිබුණි. | ඉදිරියේදී ඇතිවිය හැකි අවදානම හේතුවෙන් අඩමාණ ණය වෙන් කිරීම සිදු කර ඇත. කෙසේ නමුදු මෙම ණය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතියි. | ක්‍රමවත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී සංශෝධිත කළයුතු වේ. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු.

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය. |
|---|---|---|
| භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව රජයේ බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක් 2013 ජුනි 12 දින සිට ආරම්භ කර පවත්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුල දී මෙම ඉතිරි කිරීමේ ගිණුමේ තැන්පත් කළ රු.1,368,152,204 ක මුදලක් හා ඉතිරි කිරීමේ ගිණුමෙන් ආපසු ලබාගත් රු.1,258,743,823 ක මුදලක් මුදල් පොතේ වාර්තා කර නොතිබුණි. මේ අනුව ඉතිරි කිරීමේ ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.239,021,499 ක් අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පිළිඹිබු නොකෙරුණි. | අවසාන ගිණුමෙහි පිටු අංක 39 හි 2.8.2 වගන්තියේ හෙළිදරව් කර ඇති පරිදි ඉතිරි කිරීමේ ගිණුම ආරම්භයේ දීම එමගින් උපයනු ලබන පොලිය ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය අනුමැතිය අමාත්‍යාංශ ලේකම්වරයා මගින් ලබා ගෙන ඇත. අතපසු වීමකින් මෙම ඉතිරි කිරීමෙ ගිණුමෙහි 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය ගිණුම් කට්ටලයේ | නිසි අධිකාරී බලයක් සහිතව මූල්‍ය ගණුදෙනු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු අතර සියලුම වත්කම් විනිවිදභාවයක් සහිතව හා ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කළයුතු වේ. |

අනාවරණය කිරීමට නොහැකි විය. ඉදිරියේදී එකී අඩුපාඩුව මගහරවා ගැනීමට වගබලා ගන්නා බව දන්වා සිටිමි.

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| දේපළ හා උපකරණ | 20,987,891 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් වත්කම් පන්ති 05 ක උපලේඛන | උපලේඛන ඉදිරිපත් කරමි. | වත්කම් වෙන වෙනම හඳුනාගත හැකි පරිදි විස්තරාත්මකව උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්.

### 1.6.1 ලැබිය යුතු මුදල්.

| | විගණන නිරීක්ෂණය. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය. |
|---|---|---|---|
| (i). | ලංකා බැංකුව මගින් ක්‍රියාත්මක කර තිබුණු එක් අයෙකුට රු.200,000 ක් බැගින් වූ ව්‍යාපාරික ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී තිබූ ණය මුදල්වලින් 2015 වර්ෂයේ සිට අය නොවී පවතින රු.4,375,312 ක ණය ශේෂයක් අයකර ගැනීම සඳහා අධිකාරිය විසින් පසුවිපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් ලබාදීමේ දී එක් ප්‍රතිලාභියෙකු වෙත ලබා දුන් රු.4,800,000 ක ණය මුදලක් ද ඇතුළුව ප්‍රතිලාභීන් 41 දෙනෙකු වෙත රු.200,000 ක සීමාව ඉක්මවා රු.11,556,226 ක ණය මුදලක් ද ලබා දී තිබුණි. | මෙම ණය ක්‍රමය සැලසුම් වී තිබුණේ හානියට පත් ව්‍යාපාර එකකයක් වෙනුවෙන් රු.200,000 ක් බැගින් වන අතර එහිදී හානියට පත් එක් පුද්ගලයෙකුගේ කඩ කාමර 24 වෙනුවෙන් රු.මිලියන4.8 ක් නිදහස් කර තිබුණි. මෙම ණය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | ණය මුදල් ලබා දීම හා අයකර ගැනීම විධිමත්ව සිදු කළ යුතුවේ. |
| (ii). | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කර තිබූ ණය යෝජණා ක්‍රමයක 1990 - 1995 කාලපරිච්ඡේදය තුළ අවස්ථා 14 කදී ආයෝජනය කර තිබූ රු.128,000,000 කින් 2018 ජනවාරි 01 දිනට ආපසු අධිකාරිය වෙත අයවිය යුතු ආයෝජනයේ වටිනාකම රු.94,715,000 ක් විය. ඉන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 12 කදී රු.12,000,000 ක් අධිකාරිය වෙත ලැබී තිබුණ ද ගිවිසුම ප්‍රකාරව මෙම ආයෝජනය සඳහා සියයට 1.5 ක් බැගින් වූ පොලිය ලැබී නොතිබුණි. ගණනය කිරීම් අනුව ආසන්න වශයෙන් රු.1,337,259 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාල පොලිය උපචිත ආදායමක් ලෙස ගිණුම් ගත කර නොතිබූ අතර මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ද නොතිබුණි. | ගිණුම්කාරක සභාව මගින් උපදෙස් ලබා දී තිබුනේ එතෙක් ලැබිය යුතු පොලිය කපා හැර ආයෝජිත මුදල පමණක් අයකර ගැනීමට කටයුතු කරන ලෙසයි. පසුව මසකට රු.1,000,000 ක මුදලක් ඔවුන්ගේ අපසු ගෙවීමේ හැකියාව මත ලබා දෙන බවට එකඟ වූ අතර අදාල මුදල මේ දක්වා අය වෙමින් පවතී. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීම ක්‍රමවත්ව සිදු කර නිසි පරිදි ගිණුම් ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (iii). | වසර 10 - 3 ත් අතර කාලයක සිට පැවත එන සේවය හැරගිය හා වැඩතහනම් කරන ලද නිලධාරී දෙදෙනෙකුගෙන් අයකර ගත යුතු රු.1,157,346 ක ණය ශේෂයන් 2019 අගෝස්තු 16 දිනටත් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු එක් ණය ශේෂයක් අයවීම දිගින් දිගටම පැහැර හැරීම නිසා ඇපයට තබන දේපළ වෙන්දේසි කිරීමට නීතිපති උපදෙස් ද, අනෙක් ණය ශේෂය අයකර ගැනීමට අවසාන නිවේදනයක් යොමු කර ඇති බවද දේපළ සම්බන්ධයෙන් තක්සේරු වාර්තාවක් ලබා ගෙන ඉඩම වෙන්දේසියේ විකිණීම කරන තෙක් ඇපකරුගෙන් ණය මුදල් අයකර කිරීමට කටයුතු කරන බව දන්වමි. | ඇපකරුවන්ගෙන් ණය අයකර ගැනීම කඩිනම් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,133,159 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,384,048 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,749,111 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වෙනත් වියදම් රු.2,710,704 ක් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

| | විගණන නිරීක්ෂණය. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය. |
|---|---|---|---|
| (i). | 2018 පෙබරවාරි 28 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රතිලාභීන් 189 දෙනෙකු වෙත ණය/වන්දි මුදල් ලෙස රු.13,045,339 ක් ගෙවීමට බැංකුවට නියෝග කර තිබුණ ද 2019 ජූලි 30 දිනටත් එම මුදල් ලබාගැනීමට ප්‍රතිලාභීන් පැමිණ නොතිබුණි. වන්දි ලබා ගැනීමට නොහැකි වූ හේතු පිළිබඳ අධිකාරිය සොයා බලා නොතිබුණි. | මෙම ප්‍රමාදය අවම කර ගැනීම සඳහා ප්‍රතිලාභීන්ගේ විස්තර ප්‍රාදේශිය ලේකම්ගෙන් හා හානි පූර්ණ සහකාර නිලධාරීන්ට යොමු කර ලබා ගැනීමටත් ඉදිරියේ දී මෙවැනි ප්‍රමාදවීම් වලක්වා ගැනීමට හැකි සෑම පියවරක්ම ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වන්දි මුදල් ගෙවනු ලබන්නේ රජයේ ප්‍රතිපත්තියක් මත බැවින් නියමිත පරිදි තෝරාගත් ප්‍රතිලාභීන් වෙත වන්දි මුදල් නියමිත කාලය තුළ හා අදාළ රෙගුලාසිවලට අනුව ගෙවීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii). | අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට අනුව වන්දි ගෙවීම් යෝජනා ක්‍රම 04 ක ප්‍රතිලාභීන් 23,413 ක් වෙත රු.මිලියන 1,990 ක් වන්දි වශයෙන් ගෙවීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 15,334 ක් වෙත රු.මිලියන 1,246 ක වන්දි මුදල් පමණක් ගෙවා තිබීමෙන් වන්දි ගෙවීමේ ප්‍රතිශතය සියයට 63 ක් විය. එක් එක් වන්දි ගෙවීම් යෝජනා ක්‍රමයන්හි වන්දි ගෙවීම් ප්‍රතිශතය සියයට 48 සිට සියයට 89 දක්වා වූ පරාසයක පැවතුණි. | සමාලෝචිත වර්ෂය තුල ලත් අක්මුදල් රු.1,466,700,000 කි. එම සම්පූර්ණ මුදල වන්දි වශයෙන් ගෙවා ඇත. 2018 වර්ෂය තුලදී ගෙවීමට හැකියාව ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව 16,221 කි. එහි මූල්‍ය ප්‍රගතිය සියයට 73 ක් විය. භෞතික ප්‍රගතිය සියයට 48 සිට සියයට 89 ක පරාසයක පිහිටි අතර ඊට හේතුව වන්දි ක්‍රම 05 ක් යටතේ මුදල් ගෙවීම සිදු කිරීමය. | සැලසුම්ගත පරිදි වන්දි ගෙවීම ක්‍රමවත් විය යුතුවේ. |
| (iii). | අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ණය යෝජනා ක්‍රම 03 ක ප්‍රතිලාභීන් 3,745 ක් වෙත රු.මිලියන 722 ක් ණය වශයෙන් ගෙවීම සඳහා සැලසුම් කර තිබුණ ද 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 985 ක් සඳහා රු.මිලියන 213 ක ණය මුදලක් පමණක් ගෙවා තිබීමෙන් ණය ගෙවීම් ප්‍රගතිය සියයට 29 ක් විය. මෙම එක් එක් ණය යෝජනා ක්‍රමයන්හි ණය ගෙවීම් ප්‍රතිශතය සියයට 13 සිට සියයට 48 දක්වා වූ පරාසයක පැවතුණි. | ණය නිදහස් නොකිරීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සුරක්ෂිත ඇපකරුවන් ලබා නොදීම, ණයකරුවන් විවිධ මූල්‍ය ආයතන වල ණයකරුවන් බවට පත් වී තිබීම වැනි කාරණාය. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම බැංකු මෙන්ම ණය කරුවන් දැනුවත් කිරීම් සිදු කර ඇති බව දන්වා සිටිමි. | ණය යෝජනා ක්‍රමය මඟින් ලබාදීමට යෝජිත මුදල් ණය යෝජනා ක්‍රමයේ පිළිවිතරවලට අනුව නියමිත කාලය තුළ නිදහස් කිරීමට කටයුතු කළයුතු වේ. |
| (iv). | 2017 මාර්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2012 නොවැම්බර් 09 දින වැලිකඩ බන්ධනාගාර පරිශය තුළ සිදු වූ සිදු වීම හේතුවෙන් මරණයට පත් සිරකරුවන් 16 දෙනෙකුගෙන් දෙදෙනෙකු වෙත එක් අයෙකුට රු.2,000,000 බැගින් රු.4,000,000 ක් ද එකී සිදු වීමෙන් තුවාල ලත් පුද්ගලයින් 21 දෙනෙකුගෙන් 11 දෙනෙකු වෙත රු.500,000 බැගින් රු.5,500,000 ක් ද ගෙවිය යුතු වුවත් 2019 අගොස්තු 30 දිනටත් එම වන්දි මුදල් ගෙවා නොතිබූ අතර 2018 මාර්තු 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මහනුවර දිගන ප්‍රදේශයෙහි ඇති වූ මහජන කැළඹීම් තත්ත්වය හේතුවෙන් සිදු වූ දේපළ හානි සිදු වීම් අවස්ථා 508 කින් අවස්ථා 38 ක් සඳහා ගෙවිය යුතු වන්දි මුදල රු.31,695,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණ ද එම වන්දි මුදල් 2019 අගෝස්තු 30 දිනටත් ගෙවා නොතිබුණි. | මියගිය පුද්ගලයින් 02 ක් වෙනුවෙන් හා තුවාල ලැබූ 11 දෙනෙකු වෙනුවෙන් වන්දි ගෙවීමට ඉතිරිව පැවතුණ අතර මියගිය අයගේ යැපෙන්නන්ගේ ලඟම ඥාතීන් නොසිටීම හා ලබා දී තිබූ ලිපිනයන් නිවැරදි නොවීම ඒ සඳහා හේතු විය. වන්දි ලබා ගැනීම සඳහා අදාල පුද්ගලයින් ඉදිරිපත් වුවහොත් ඉදිරියේ දී සහන සැලසීමට හැකි බව සඳහන් කරමි. | අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි වන්දි මුදල් ගෙවා අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කළයුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

| විගණන නිරීක්ෂණය. | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය. |
|---|---|---|---|
| (i). | කර්මාන්ත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2001 දෙසැම්බර් 30 දින ලංකා බැංකුට දී තිබුණු රු.6,000,000 ක මුදල ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කාලය අවසන් වූ පසු 2011 දෙසැම්බර් 31 දිනට කල්පිරී අධිකාරිය වෙත නැවත ප්‍රතිපූර්ණය විය යුතු වුවත් එම මුදල අධිකාරි වෙත ලැබී නොතිබුණි. එම මුදල නැවත ලබා ගැනීමට හෝ විධිමත් ගිවිසුම් මත නැවත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හෝ අධිකාරිය කටයුතු කර නොතිබුණි. | මෙම මුදල වසර 10 කින් අපවෙත ලබා දිය යුතු බව ගිවිසුමේ සඳහන් කර තිබුණ ද අදාල ණය යෝජනා ක්‍රමය තවදුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව සමග සාකච්ඡා කර නැවත එම මුදල තවත් වසර 10 ක් බැංකුවේ රඳවා තැබීමට කටයුතු කර ඇත. එබැවින් කල්පිරුනු රු.මිලියන 6 මුදල නැවත ලබා නොගත් බව දන්වා සිටිමි. | ප්‍රතිපූර්ණය කරගත යුතු ලැබීම් නොපමාව ප්‍රතිපූර්ණය කරගෙන නිසි අනුමැතියන් සහිතව හා විධිමත්ව ගිවිසුම්වලට එළඹ ණය යෝජනා ක්‍රමය ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වේ. |
| (ii). | 1995 - 1990 කාලපරිච්ඡේදය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආයෝජනය කර තිබූ රු.මිලියන 128 ක් කල්පිරී 2006 - 2019 කාලපරිච්ඡේදය තුළ අධිකාරිය වෙත ලැබිය යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 45 ක් පමණක් ලැබී තිබුණි. | නිරීක්ෂණය නිවැරදි වේ. නිවාස ණය යෝජනා ක්‍රමය සඳහා ලංකා බැංකුව වෙත මුදල් නිදහස් කරනුයේ අයදුම්කරුවන් වෙත බැංකුව විසින් ණය මුදල් නිදහස් කරනු ලබන ප්‍රගතිය අනුව බව දන්වා සිටිමි. | ලැබිය යුතු මුදල් අදාළ ආයතන සමඟ කථිකා කොට නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (iii). | අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා උපයෝජනය කිරීමට යොදවා ගතයුතු ආයෝජන පොලී රු.21,214,762 ක් හා ආයෝජන කල්පිරීමෙන් ලැබී තිබුණු රු.26,650,000 ක් ඇතුලුව රු.55,842,722 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් කිසිදු කාර්යයක් සඳහා යොදවා ගැනීමකින් තොරව වර්ෂයක පමණ කාලයක් බැංකු ගිණුමේ නිශ්ක්‍රියව රඳවා තිබුණි. | යෝග්‍ය ව්‍යාපෘතියක ආයෝජනය කරනතෙක් එකී මුදල් ප්‍රමාණය මෙසේ රඳවා තබාගන්නා බව එවකට සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ලද අතර හානි පූර්ණ කාර්යාලය ස්ථාපිතවීමෙන් පසුව නව ප්‍රතිපත්ති සකස් කරන තුරු අදාල මුදල් රඳවා ගැනීමට සිදු විය. | මූල්‍ය වත්කම් ආයතනයේ කටයුතුවලට බාධා නොවන පරිදි ආයෝජනවල යොදවා නිශ්ක්‍රියව තිබීම වලක්වා ගතයුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය.

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

| විගණන නිරීක්ෂණය. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම. | නිර්දේශය. |
|---|---|---|
| 2018 ඔක්තෝබර් මස 26 දිනැති අංක 34 දරන හානි පූර්ණය සඳහා වන කාර්යාල පනත මගින් 1987 අංක 29 දරන තැනැත්තන් දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත ඉවත් කර හානි පූර්ණය සඳහා වන කාර්යාලය පිහිටුවා තිබුණි. මෙම පනතේ 26 වන වගන්තියෙහි සඳහන් ඉවත් කිරීම්, ඉතිරි කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන අනුව තැනැත්තන් දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය | 2018 වර්ෂය තුලදී හානි පූර්ණය සඳහා වන කාර්යාලය ස්ථාපිත නොවූ අතර ඊ සඳහා සභාපතිවරයෙකු ඇතුළු කමිටු සාමාජිකයින් 05 ක් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින් පත්කරනු ලබන්නේ 2019 අප්‍රේල් 01 දින සිටය. පනතේ 26 වන වගන්තිය අනුව කටයුතු කිරීමට නොහැකි වූයේ | ව්‍යුහගත කිරීම් ඇති කළද නිසි පරිදි සැසඳීම් සිදු කර අදාළ වත්කම් හා වගකීම් නියමිත පරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළයුතු වේ. |

කිරීමේ අධිකාරිය සතු වත්කම් හා වගකීම් හානි පූර්ණය සඳහා වන කාර්යාලය වෙත පැවරීමේ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. 2018 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා හානි පූර්ණය සඳහා වන කාර්යාලය නමින් වෙනම මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා තැනැත්තන් දේපළ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය නමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

හානි පූර්ණ කාර්යාලය ස්ථාපිත වී නොතිබූ බැවිනි. ඉදිරියේදී ඉහත වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගතිමි.